# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1942/14 - 2015 නොවැම්බර් මස 24 වැනි අඟහරුවාදා - 2015.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

නියෝග අංක - 35

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු අධිකාරිය පනත**

20(5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(5) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම නිෂ්පාදකයෙකු, ආනයනකරුවකු, අසුරන්නකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් පහත දක්වා ඇති භාණ්ඩ එහි සඳහන් කර ඇති උපරිම සිල්ලර මිලට වඩා වැඩියෙන් වෙළෙඳාම් කිරීම, වෙළෙඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළෙඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

| *නිෂ්පාදනය* | *උපරිම සිල්ලර මිල* |
|---|---|
| වියළි හාල්මැස්සන් | කි. ග්‍රෑ. 1 රු. 410.00 |
| පරිප්පු | කි. ග්‍රෑ. 1 රු. 169.00 |
| ''කට්ටා'' කරවල | කි. ග්‍රෑ. 1 රු. 1,100.00 |
| ''සාලයා'' කරවල | කි. ග්‍රෑ. 1 රු. 425.00 |
| කඩල | කි. ග්‍රෑ. 1 රු. 169.00 |
| දේශීය කිරිපිටි | ග්‍රෑම් 400 පැකට්ටුව රු. 295.00 |

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2015 මාර්තු මස 19 වැනි දින අංක 1906/47 දරන රජයේ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝග අංක 32හි ''වියළි හාල්මැස්සන් (ආනයනික) (බහාලුම් රහිත)'' හා 2015 ජූලි මස 27 වැනි දින අංක 1925/3 දරන රජයේ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝග අංක 34හි ''වියළි හාල්මැස්සන් (ආනයනික) (බහාලුම් සහිත)'' යන අයිතමයන් මෙයින් ඉවත් කරනු ලැබේ.

මෙම නියෝගය 2015 නොවැම්බර් මස 24 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

හසිත තිලකරත්න,
*වැ. බ. සභාපති.*

2015 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

12-355

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - PG 2697— 206(2015/11)